# තෙත්බිම් ශාක

- ආවේණික
- ආක්‍රමණික

ජලයේ ගිලී වැඩෙන ශාක (මූල පද්ධතිය පතුලට සම්බන්ධ වී ඇති) - නෙළුම්, මානෙල්, කෙකටිය, කෙටල

ජලයේ මතුපිට පාවෙන ශාක - දිය පරඬැල්, ජපන් ජබර, සැල්වීනියා, ලුඩ්විජියා

ජලය ආශ්‍රිතව වැඩෙන ශාක - ගොන් කදුරු, වැටකෙයියා, දිවි කදුරු, දිය මිදෙල්ල, කුඹුක්, බෙලිපට්ටා, වෙල් ආතා, ලේන්තැරි, ගිරිතිල්ල

ගොඩබිම් ශාක - දොඹ, මී, මුරුත, කුරුඳු, හැලඹ, අඬනහිරියා, ඔළිඳ, කුරුඳු

## ශාකවල වැදගත්කම

ශාක, ප්‍රභාසංස්ලේෂණය මගින් ආහාර නිෂ්පාදනය කරමින් මිනිසා ඇතුළු සියළුම සත්වයින්ගේ ආහාර අවශ්‍යතා සපුරාලයි. සියළුම ජීවීන්ගේ ශ්වසනයට අවශ්‍ය ඔක්සිජන් වායුව නිපදවයි. කාබන්ඩයොක්සයිඩ් වායුව අවශෝෂණය කරමින් හරිතාගාර ආවරණය පාලනය කරමින් පරිසරය සිසිල් කරයි. එය දේශගුණ විපර්යාස පාලනය කිරීමට වැදගත් වේ. ශාක, සතුන්ට වාසස්ථාන හා කැදලි තැනීමට උපස්ථර සපයයි. තෙත්බිම් ශාකවලට අපවිත්‍ර වූ ජලය පිරිසිදු කිරීමේ හැකියාව පවතියි. ඇතැම් ශාක ඝන අපද්‍රව්‍ය ජලය හරහා ව්‍යාප්ත වීම පාලනය කරන භෞතික බාධකයක් ලෙස ක්‍රියා කරයි. ශාක මුල්වල ව්‍යාප්තිය මගින් පාංශු ඛාදනය පාලනය කරයි. ඇතැම් ශාක වලින් ඖෂධ ලබා ගත හැක.




# තලංගම තෙත් බිමට ඇති තර්ජන සහ විසඳුම්

| තර්ජන | විසඳුම් |
|---|---|
| පරිසර දූෂණය (දූෂක-කසළ ගිනි තැබීම නිසා වාතයට නිදහස් වන දුම, අපජලය, ඝන අපද්‍රව්‍ය, කෘමිනාශක, රසායනික පොහොර) | කසළ ජනනය අවම කිරීම, නැවත ප්‍රයෝජනයට ගැනීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම, අපජලය පිරිපහදු කිරීමේ ක්‍රම හඳුන්වා දීම |
| තෙත් බිම් ගොඩ කිරීම | නීතිය ක්‍රියාත්මක කිරීම, මනා කළමණාකාරීත්වයකින් යුතුව මිනිස් ක්‍රියාකාරකම් සඳහා භූමිය පරිහරනය කිරීමේ ක්‍රම සඳහා ජනතාව දිරිගැන්වීම. (උදා-මහල් ගොඩනැගිලි ඉදිකිරීම මඟින් භූමි පරිභෝජනය අවම කිරීම) |
| නීතියෙන් ආරක්ෂිත සතුන් දඩයම් කිරීම, නීති විරෝධී ලෙස ජීවීන් හෝ කොටස් එකතු කිරීම | නීතිය ක්‍රියාත්මක කිරීම හා දැනුවත් කිරීම |
| මාර්ග අනතුරු නිසා සත්වයින් මිය යාම සහ ආබාධිත වීම | තෙත්බිම හරහා යන රථවාහන සඳහා වේග සීමා නියම කිරීම, වේගය සීමා කිරීමට වැටි ඉදිකිරීම, සතුන්ට මාරු වීම සඳහා මාර්ග හරහා උමං හෝ පාලම් ඉදිකිරීම, තෙත්බිම ගොඩකර මාර්ග ඉදිකිරීම වෙනුවට ඒවා කණු මත ඉදි කිරීම, සතුන් (විශේෂයෙන් කුරුල්ලන්) රථ වාහන හරහා ගමන් කිරීම වැලැක්වෙන ආකාරයට මාර්ගය දෙපස දැල් සවි කිරීම. |
| ආගන්තුක ආක්‍රමණශීලී ශාක සහ සත්ව විශේෂවල ව්‍යාප්තිය | එවැනි ජීවීන් ඉවත් කිරීම සහ අවශ්‍ය පරිදි වෙනත් දේශීය විශේෂ වලින් ප්‍රතිස්ථාපනය කිරීම. ඇතැම් ආක්‍රමණශීලී විශේෂ, දේශීය විශේෂ සමග පාරිසරික සම්බන්ධතා ගොඩ නගාගෙන සිටින බැවින් එම ආක්‍රමණශීලී විශේෂ ඉවත් කළ යුත්තේ ක්‍රමානුකූලව යි. |

**පොදු විසඳුම් -**

තලංගම තෙත්බිම ඇතුළු සියලු ස්වභාවික සම්පත් වල වැදගත්කම සහ ඒවා විනාශ කිරීමෙන් අත්වන අහිතකර ප්‍රතිඵල පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සහ යහපත් ආකල්ප ගොඩනැගීම.

සුදුසු කාල පරිච්ඡේද වලදී විද්‍යානුකූල අධ්‍යයනයන් සිදු කරමින් තෙත්බිමේ පාරිසරික තත්ව ඇගයීමට ලක් කරමින් කාලානුරූපීව නිසි සංරක්ෂණ ක්‍රියාමාර්ග දියත් කිරීම.

## තලංගම තෙත්බිමෙන් සිදුවන පොදු සේවාවන්



▲ තෙත්බිමෙන් ආහාර ලබාගන්නා ගවයින්



ජලය එක් රැස් කිරීම, පරිවහනය කිරීම සහ වාෂ්පීකරණය ආදී ක්‍රියාදාම මගින් ජල චක්‍රය පවත්වාගෙන යාමට දායක වීම, කුඹුරු සහ වෙනත් වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබාගැනීමට හැකි වීම, වගා කටයුතු සහ කිරි නිෂ්පාදනය සඳහා යොදාගන්නා ගවයින්ට අවශ්‍ය ආහාර සහ ජලය සැපයීම තලංගම තෙත්බිම හරහා සිදුවන ප්‍රධාන සේවාවන් වේ. ඇතැම් ගැමියන් නෙළුම් ආදී මල් නෙලා විකුණා ආදායම් උපයා ගනියි. තෙත්බිම නිසා ප්‍රදේශවාසීන්ට විනෝදාශ්වාදය, මානසික සුවය සහ ජීවත් වීමට සෞම්‍ය පරිසරයක් නිර්මණය වී ඇත. අධ්‍යාපන සහ පර්යේෂණ කටයුතු සඳහා තෙත්බිම යොදා ගත හැකිය. පාරිසරික සංචාරක කර්මාන්තය සඳහාද මෙය සුදුසු බිම් පෙදෙසකි.


People to People Volunteers

The GEF Small Grants Programme

UNDP — Empowered lives. Resilient nations.

NATURE LOVER — biologistrukmal@gmail.com

පීපල් ටු පීපල් වොලන්ටියර්ස් ආයතනය මගින්, ජගත් පාරිසරික පහසුකම් සුළු මූල්‍යාධාර වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන්, තලංගම තෙත් බිම් පරිසර ආරක්ෂක කලාපය ආශ්‍රිතව ක්‍රියාත්මක කරන ලද ජෛව විවිධත්ව සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ නිර්මාණය කරන ලදී.



ප්‍රකාශන අයිතිය © 2020 - People to People volunteers



peoplepeopleto@yahoo.com (071-7007771)

| සටහන් සහ ඡායාරූප | සටහන් සංස්කරණය | පිරිසැලසුම් නිර්මාණය |
|---|---|---|
| රුක්මල් රත්නායක | නර්මදා දංගම්පොල | දුෂාන් මුතුනායක |


# තලංගම

## තෙත්බිම්

### පරිසර ආරක්ෂක කලාපය






පීපල් ටු පීපල් ස්වේච්චා සේවකයෝ

නො. 10, තලාහේන, මීගමුව


## වැදගත්කම



තලංගම වැව

තලංගම පරිසර ආරක්ෂක කලාපය සුවිශේෂී පාරිසරික සේවාවන් රැසක් ඉටුකරන තෙත්බිම් පරිසර පද්ධතියකි. මෙය අප රටට ආවේණික විශේෂ, දේශීය විශේෂ සහ සංක්‍රමණික පක්ෂීන් මෙන්ම වඳවීමේ තර්ජනයට ලක්ව සිටින සත්ව හා ශාක විශේෂ ආදී ජීවී විශේෂ රාශියකගේ වාසභූමියකි. 15 වන සියවසේ, කෝට්ටේ රාජධානි සමයේ, හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් තලංගම වැව කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය එක් රැස්කිරීමට සහ ඇතුන් නැහැවීම සඳහා තනන ලද්දක් බව ඉතිහාසයේ කියවේ. එමෙන්ම අද වන විට විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙම පරිසර පද්ධතිය විනාශ වී යාමේ අවධානමට මුහුණ දී ඇත. මෙම සියළු කරුණු සලකා, වසර 2007 දී මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ජාතික පාරිසරික පනත යටතේ, තලංගම තෙත් බිම් ප්‍රදේශයේ හෙක්ටයාර 118ක භූමි ප්‍රමාණයක් පරිසර ආරක්ෂක කලාපයක් ලෙස නම් කර ඇත. එමෙන්ම මෙය, 2018 වසරේදී රැම්සාර් සම්මුතිය මඟින් නම්කරන ලද, කොළඹ තෙත්බිම් නගරයට අයත්වන තෙත්බිමකි.




තලංගම පරිසර ආරක්ෂක කලාපය

තලංගම තෙත්බිම, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බත්තරමුල්ල නගරයට ආසන්නව පිහිටා ඇත. මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප අතුරින් පහතරට තෙත් කලාපයට අයත් වේ. වාර්ෂික වර්ෂාපතනය මි.මි. 2500 ක් පමණ වන අතර මුහුදු මට්ටමේ සිට උස මීටර 9ක් පමණ වේ. කැළණි ගංගා ද්‍රෝණියට අයත් වේ. නිරිතදිග මෝසම් වර්ෂාව මඟින් සහ හෝමාගම, කොට්ටාව වැනි ප්‍රදේශවල සිට ගලා එන ජලය මඟින් තෙත්බිම පෝෂණය වේ. තෙත්බිමේ ජලය ඇල මාර්ගයක් ඔස්සේ අඹතලේ ප්‍රදේශයේදී කැළණි ගඟ හා මුසුවේ.

## පරිසර ආරක්ෂක කලාපයේ සැකැස්ම

මෙම තෙත් බිම, ප්‍රධාන වශයෙන් තලංගම වැව සහ ඇවරිහේන වැව නමින් වැව් දෙකක්, එම වැව් යා කෙරෙන ඇල මාර්ගයක්, එම වැව්වලින් ආරම්භවන වාරි ඇලවල් දෙකක්, ඇවරිහේන වැවේ සිට කැළණි ගඟ දක්වා ජලය ගෙන එන තවත් ඇල මාර්ගයක්, වගුරු බිම්, තෙත්බිම් ශාකවලින් සමන්විත වනවදුළු සහ බටපොත වෙල් යාය යනාදියෙන් සමන්විතයි. මෙම සියල්ලම විවිධවූ තෙත්බිම් පරිසර පද්ධති ආකාර වේ. ගොඩබිම් ශාක සහිත ලඳු කැලෑද හමුවේ. ආරක්ෂක කලාපයේ සීමාවට අයත් නොවුනත්, තුරුලතා වලින් ගහනවූ ජෛව විවිධත්වය අතින් ඉහළ වූ ගෙවතු ද ප්‍රදේශයේ ඉතා සුලබය.




## පිහිටීම, දේශගුණය සහ භූගෝලීය පසුබිම



